"මානව සම්පත ඵලදායී කළමනාකරණයේ ප්‍රමුඛයා"
"வினைத்திறன் மிக்க மனிதவள முகாமைத்துவ முன்னோடி"
"Leader in effective Human Resource Management"

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
Uva Provincial Council

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය
பிரதி பிரதான செயலாளர் (ஆளணி மற்றும் பயிற்சி) காரியாலயம்
OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (PERSONNEL & TRAINING)
රජ වීදිය, බදුල්ල  இராஜ வீதி, பதுளை  King's Street, Badulla.

ඔබේ අංකය / உமது இல. / Your No.

මගේ අංකය / எனது இல. / My No.

දිනය / திகதி / Date: 2017.05. 18

## 2017 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම

2017 පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි, රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරි සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩල සඳහා වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විවිධ වෘත්තීය සංවිධාන, රාජ්‍ය නිලධාරි කණ්ඩායම් හා ආයතන වශයෙන් ඉදිරිපත් කර තිබූ කරුණු ද සලකා බලා, විශේෂයෙන් රාජ්‍ය සේවයේ ස්ථාන මාරු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමේ නීතිමය අවශ්‍යතාවය සහ පළාත් රාජ්‍ය සේවයේ සේවා ගණයන් සඳහා විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කල යුතු බව යන කරුණු සම්බන්ධයෙන්, ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ඌව පළාත් ප්‍රධාන ලේකම්, ඌව පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්, ආණ්ඩුකාරවර ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) යන නිලධාරින් සහභාගි වී 2017.05.17 දින ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී කරන ලද සාකච්ඡාවේදී ගත් තීරණය පරිදි 2017 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝග අවලංගු කරන ලෙසටත්, අදාළ සියලු සේවා ගණ සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තීන් සමාලෝචනය කර විධිමත්ව සකස් කර ඊට සභාවේ අනුමතිය ලබා ගැනීමටත් ඒ අනුව, 2018 වර්ෂය සඳහා ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කරන ලෙසටත් ගරු ආණ්ඩුකාරතුමා නියෝග කර ඇත.

ඒ අනුව, 2017.05.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි මේ වන විට නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝග සියල්ල ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි මෙයින් අවලංගු කරමි.

එසේම නව ස්ථානමාරු ප්‍රතිපත්ති ප්‍රකාරව 2018.01.01 දිනට 2018 වර්ෂයේ ස්ථානමාරු ක්‍රියාත්මක වන බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

ගාමිණී රාජකරුණා
ඌව පළාතේ ප්‍රධාන ලේකම්

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary - 055-2222809
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) / பிரதி பிரதான செயலாளர் (ஆளணி மற்றும் பயிற்சி) / Deputy Chief Secretary (Personnel & Training) - 055-2228626
ෆැක්ස් / தொலைநகல் / Fax - 055-2228700
සහකාර ප්‍රධාන ලේකම් / உதவி பிரதான செயலாளர் / Asst. Chief Secretary - 055-2229425
පරිපාලන නිලධාරි / நிருவாக உத்தியோகத்தர் / Administrative Officer - 055-2228627
පොදු දුරකථන අංක / பொது தொலைபேசி இல. / General Telephone Nos. - 055-2222804, 2222810, 055-2222712
වෙබ් ලිපිනය / வலைத்தளம் / Web Site - www.uvadcspt.lk
විද්‍යුත් තැපැල් ලිපිනය / மின்னஞ்சல் / E-Mail Address - upcdcspt@gmail.com